(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

**අංක 1(2).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 සැප්තැම්බර් 01 බ්‍රහස්පතින්දා**

---

**2022 සැප්තැම්බර් 06 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2022 සැප්තැම්බර් 09 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.23/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළෙඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— දුම්රිය මැදිරි දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම,— දුම්රිය දෙපාර්තුමේන්තුව විශාල භෞතික හා මානව සම්පත්වලින් සමන්විත දෙපාර්තුමේන්තුවක් වන හෙයින් ද, මෙරට දුම්රිය මැදිරි විදේශ රටවලින් ආනයනය කිරීමේදී විශාල මුදලක් විදේශ රටවලට ගලා යන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට දුම්රිය මැදිරි මෙරට නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කටුවැල් බටු දේශීය වශයෙන් වගා කිරීම,— පසුගිය වසර කිහිපය තුළ කටුවැල් බටු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට ඇදී ගිය හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා දේශීය වශයෙන් කටුවැල් බටු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— ඉඟුරු වගාව ප්‍රවර්ධනය කිරීම,— පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවට ඉඟුරු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී ගිය හෙයින් මෙරටින් විදේශ රටවලට විශාල වශයෙන් ධනය ගලායාම වැළැක්වීම සඳහා ද, ඉඟුරු වගාව දේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ද, කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— උදර්පණ පනත යටතේ නියමය,— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ 3(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර උදර්පණ ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2022 මැයි 31 දිනැති අංක 2282/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.08.29 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අගෝස්තු 05 දිනැති අංක 2291/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.08.31 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 126 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 මාර්තු 31 දිනැති අංක 2273/76 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.08.29 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2022 සැප්තැම්බර් 21 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2551/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වරාය හා නාවික කටයතු විෂය භාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2565/2022

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයේ පුල්මුඩේ කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරනු ලබන ඉල්මනයිට් අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015 සිට මේ දක්වා එම ඉල්මනයිට් අපනයන කිරීමෙන් උපයා ඇති විදේශ විනිමය කොපමණද;

(iii) ඉල්මනයිට් භාවිතා කර ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එසේ නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇති භාණ්ඩ වර්ග කවරේද;

(v) මේ වනවිට පුල්මුඩේ කර්මාන්තශාලාවේ ඇති ඉල්මනයිට් තොග ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2576/2022

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) එම කොට්ඨාසවල මේ වනවිට සැරිසරන වන අලින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වන අලි පලවා හැරීමේ කටයුතුවල නිරතවී සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම නිලධාරී හිඟය මහහරවා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2583/2022

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන රථ රියදුරන් වෙනුවෙන් "රිය ශක්ති" නමින් සහන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, එම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීම සඳහා මේ වනවිට ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඉල්ලුම් පත්‍ර අතරින් මේ වනවිට ණය ලබා ගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය යෝජනා ක්‍රමය ඉදිරියටත් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2587/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල පවතින රියදුරු හා කොන්දොස්තර තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීමේදී, එම පුරප්පාඩු පවතින ඩිපෝව පිහිටි දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් පමණක් බඳවාගැනීමෙන් පඩි රහිත නිවාඩු ලබා ගැනීම සහ සේවය අතහැරයාම අඩු වන බවත්;

(ii) එමඟින් ඔවුන්ගෙන් වඩාත් ඵලදායි හා ගුණාත්මක සේවයක් ලබා ගත හැකි බවත්;

(iii) එමඟින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් කාර්යක්ෂම හා තරඟකාරී මඟී ප්‍රවාහන සේවයක් ලබා දීමට හැකියාව පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත සඳහන් තනතුරු සඳහා බඳවාගැනීමේදී, එම පුරප්පාඩු පවතින ඩිපෝව පිහිටි දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් පමණක් බඳවාගැනීම සඳහා කටයුතු නොකිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2602/2022

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල්ගහවෙල-කුරුණෑගල දුම්රිය මාර්ගය, ද්විත්ව මාර්ගයක් බවට පත්කිරීමේ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ ශක්‍යතා වාර්තා සකස් කිරීම අවසන් කර තිබේද;

(iii) එම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලබන දිනය සහ අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2614/2022

ගරු අනුප පස්කුවල් මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සත්වෝද්‍යාන මඟින් සැලකිය යුතු ආදායමක් උපයනු ලබන බවත්;

(ii) මේ වනවිට එම සත්වෝද්‍යානවල සිටින සතුන්ට අවශ්‍ය ආහාරවල හිඟයක් පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සත්වෝද්‍යානවලින් මේ වනවිට උපයනු ලබන ආදායම කොපමණද;

(ii) ආපදා අවස්ථාවලදී එම ආදායමෙන් සත්වෝද්‍යානවල සිටින සතුන්ට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ක්‍රමවේදයක් යෝජනා කරන්නේද;

(iii) ශ්‍රී ලංකාවේ වන ජීවීන් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2621/2022

ගරු ඩී. වීරසිංහ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ඖෂධ මිල ඉහළ ගොස් ඇති බව දන්නේද;

(ii) ඖෂධ ආනයනය කිරීමේදී තීරු බදු අය කරන්නේද;

(iii) නොඑසේ නම්, ඖෂධ සඳහා අධික මිල ගණන් අය කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකම ඖෂධය සඳහා අලෙවිකරුවන් විසින් විවිධ මිල ගණන් අය කරනු ලබන බව දන්නේද;

(ii) එම අලෙවිකරුවන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2629/2022

ගරු සම්පත් අතුකෝරළ මහතා,— සංචාරක සහ ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ස්ථාපිත කර ඇති සංචාරක කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) වර්ෂ 2018 සිට මේ දක්වා එම එක් එක් සංචාරක කලාපය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2640/2022

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම්වල මේ වනවිට පදිංචි වී සිටින පදිංචිකරුවන් සඳහා හිමිකම්පත් ලබා දී තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට ලබා දී ඇති හිමිකම්පත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාව සතු ඉඩම්, බදු පදනම මත ලබා දී තිබේද;

(ii) ඉදිරියේදී ද එලෙස බදු පදනම මත ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 සැප්තැම්බර් 22 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ රජයේ ව්‍යවස්ථාපිත ආයතන සඳහා අත්කර ගනු ලබන ඉඩම්වලට ගෙවිය යුතු වන්දි සහ අනෙකුත් පරිපාලන වියදම් අදාළ ආයතනය විසින් දැරිය යුතු බවත්;

(ii) එසේ වුව ද, එම ආයතනවලට මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන ඒ සඳහා භාවිතා කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ව්‍යවස්ථාපිත ආයතනවලට අත්කර ගනු ලබන පෞද්ගලික ඉඩම්, එම ආයතනවලට පැවරීමට අදාළ ක්‍රමවේදය;

(ii) ඊට අදාළ නීතිය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ව්‍යවස්ථාපිත ආයතන සඳහා අත්කර ගනු ලබන පෞද්ගලික ඉඩම්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව පැවරීමේ සහතිකයක් මඟින් එම ආයතනවලට පවරන ලෙස ඉඩම් අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දී ඇති බවත්;

(ii) එසේ උපදෙස් ලබා දීම, ඉහත පනතේ විධිවිධානවලට, ඉඩම් නියෝගවලට සහ චක්‍රලේඛවලට පටහැනි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

28/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්වභාවිකව වැවෙන මිනිස් ආහාරයට සුදුසු බිම්මල් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම බිම්මල් වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) ඒ අතරින් ඒකදේශික බිම්මල් වර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ස්වයං රැකියාවක් ලෙස බිම්මල් වගා කරනු ලබන වගාකරුවන්ට අවශ්‍ය බීජ ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) ඒ සඳහා වර්ෂයකට වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) දේශීය බිම්මල් බීජ, වගාකරුවන් අතර ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බිම්මල් වගාකරුවන්ට රජය සහන ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

296/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හන්තාන සිට සුදුහුම්පොළ දක්වා ජලය බැස යන ඇළ මාර්ගයක් තිබෙන බවත්;

(ii) එම ඇළ මාර්ගය අවහිර වන අයුරින් ඇතැම් ස්ථානවල අනවසර ඉදිකිරීම් සිදු කර ඇති බවත්;

(iii) වර්ෂා කාලයේදී එම ඇළ මාර්ගය අවහිර වීම හේතුවෙන් අවට ප්‍රදේශවාසීන්ගේ නිවාස ජලයෙන් යටවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ඇළ මාර්ගය අවහිර වීම හේතුවෙන් ජල ගැලීම්වලට මුහුණ දෙන සුදුහුම්පොළ ප්‍රදේශය අවට පදිංචිකරුවන්ට ලබා දෙනු ලබන ස්ථිර විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

342/2022

ගරු හේෂා විතානගේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ සිදු වූ පරිසර දූෂණයට අදාළව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) පැමිණිලි වර්ගීකරණය අනුව ඒ අතරින් වැඩි වශයෙන් ලැබී ඇති පැමිණිලි වර්ගය කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් පැමිණිලි අතරින් මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ණ අනුමතිය ලබා දී ඇති ආයතන සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ නීති රීති අනුව කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රත්නපුර මහ නගර බලප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති කර්මාන්තශාලාවලින් සිදු කරනු ලබන පරිසර දූෂණය සම්බන්ධයෙන් පරීක්ෂා කර තිබේද;

(ii) ජලයට බැර ලෝහ එකතුවීම, වායු දූෂණය සහ ශබ්ද දූෂණය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරීක්ෂාවට ලක් කරන ලද ආයතන කවරේද;

(iii) එම පරීක්ෂා කිරීම් අනුව එළඹ ඇති නිගමන කවරේද;

(iv) ජාතික පාරිසරික පනත අනුව ලබා දී ඇති උපදෙස් නොසලකා කටයුතු කිරීම හේතුවෙන් මේ වනවිට නීතිමය පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

674/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ඇතුළු ප්‍රදේශ රැසක ජීවත්වන පවුල් විශාල සංඛ්‍යාවක් විසිතුරු මල් වගා කිරීමේ නිරත වන බවත්;

(ii) එම වගාකරුවන්ට අවශ්‍ය පස් ලබා ගැනීමේ දුෂ්කරතා සහ මල් සඳහා ස්ථාවර මිලක් නොමැති වීම හේතුවෙන් ඔවුන් ගැටලු රැසකට මුහුණ දී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත සඳහන් ගැටලු විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2645/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේදී පනවන ලද රසායනික පොහොර තහනම හේතුවෙන් ශ්‍රී ලංකාවට සිදු වූ ආර්ථික බලපෑම ගණනය කර තිබේද;.

(ii) එසේ නම්, වී, තේ, රබර්, කුරුඳු , පොල්, සහ එළවළු ආදී එක් එක් භෝගයේ නිෂ්පාදනයේ සිදු වූ පහත වැටීම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රසායනික පොහොර තහනම් කිරීම හේතුවෙන් ගොවීන් ගොවිතැන් කිරීමෙන් ඉවත් වී තිබේද;

(iv) එසේ නම්, එම ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2648/2022

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීට වර්ෂ කිහිපයකට පෙර "කෘෂි අපනයන ගම්මාන" නමින් වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක වූ බවත්;

(ii) මේ වනවිට එම වැඩසටහන නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, "කෘෂි අපනයන ගම්මාන" වැඩසටහන නැවත ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2658/2022

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූර්ය විදුලිබල පද්ධති ලබා ගැනීම සඳහා ජනතාව දැඩි උනන්දුවක් දක්වන බවත්;

(ii) එහෙත් පැනල් හා ඉන්වර්ටර් මිල ඉතා අධික වීම හේතුවෙන් සූර්ය විදුලිබල පද්ධති ලබා ගැනීමේ දුෂ්කරතා මතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සූර්ය විදුලිබල පද්ධති, පැනල් සහ ඉන්වර්ටර් ඇතුළු අවශ්‍ය උපකරණ පහසු මිලට ලබාගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) සූර්ය විදුලිබල පද්ධති සවිකරනු ලබන ආයතන විසින් විවිධ මිල ගණන් යටතේ ඒවා අලෙවි කරනු ලබන බව දන්නේද;

(iii) එසේ නම්, එම පද්ධති සඳහා නිශ්චිත මිලක් නියම කිරීමට කටයුතු කරන්නේද;

(iv) සවිකරන ලද එම පද්ධති සඳහා, ලංකා විදුලිබල මණ්ඩලයේ සම්බන්ධතාවය ලබාදීමේදී පවතින ප්‍රමාදය මඟහරවා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2669/2022

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම් දිස්ත්‍රික්කයේ රජයේ පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට කොවිඩ්-19 රෝගය සඳහා එන්නත ලබා ගෙන ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) කොවිඩ්-19 රෝගය සඳහා එන්නත්කරණ වැඩසටහන මේ වනවිට පාසල් සිසුන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2689/2022

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම්, පෞද්ගලීකරණය කර තිබූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ එවකට ඇපලෝ රෝහල නැවත රජයට පවරා ගන්නා ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද නියෝගය ප්‍රකාරව ඊට වගකිව යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර පිළිබඳව 2016.08.23 දින මා විසින් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් ඇසූ බවත්;

(ii) පෙර පැවති රජය කිසිදු පියවරක් නොගැනීම හේතුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් සී. ආර්. අයි. /159/2016 දරන අංකය යටතේ නැවත ලිපි ගොනුවක් ආරම්භ කර 55 දෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කර ගත් අතර තවත් කීපදෙනෙකුගෙන් ප්‍රකාශ ලබා ගත් පසුව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව එම ප්‍රශ්නය සඳහා පිළිතුර ලෙස ලබා දෙන ලද බවත්;

(iii) ඒ අනුව, විමර්ශන කටයුතු අවසන් කර තොරතුරු පොතේ උධෘත ලැබුණු පසු ඉදිරි පියවර ගන්නා බවට නීතිපතිවරයා දන්වා ඇති බව වැඩිදුරටත් සඳහන් කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඊට පසුව නීතිපතිවරයා විසින් වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 සැප්තැම්බර් 23 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

967/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාලච්චේන කඩදාසි කර්මාන්තශාලාවේ වර්තමාන තත්ත්වය;

(ii) එම කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග;

(iii) ඒ සඳහා ආයෝජනය කරන ලද මුදල හා එම මුදල ආයෝජනය කරන ලද දිනය;

(iv) එමඟින් උත්පාදනය වන රැකියා සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කර්මාන්තශාලාව සම්බන්ධයෙන් වංචා හා දූෂණ සිදු වන බව දන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1107/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කරන ලද දිනය කවරේද;

(ii) එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ කවරේද;

(iii) එම බැඳුම්කර වංචාවට සෘජුවම සම්බන්ධ පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1514/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට පෙර පළාත් පාලන ආයතනවල සභිකයන් ලෙස කටයුතු කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියා සේවය කරන ලද ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් අතරින් සභාපති/උප සභාපති/නගරාධිපති/උප නගරාධිපති ලෙස කටයුතු කරන ලද සංඛ්‍යාව හා එම පළාත් පාලන ආයතන කවරේද;

(iv) ඉහත (i) හි සඳහන් නිලධාරීන් අතරින් පළාත් පාලන ආයතනවල සභිකයන් ලෙස කටයුතු කරන ලද සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් අතරින් සභාපති/උප සභාපති/නගරාධිපති/උප නගරාධිපති ලෙස කටයුතු කරන ලද සංඛ්‍යාව හා එම පළාත් පාලන ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ක්ෂේත්‍ර නිලධාරීන්ට මැතිවරණයට ඉදිරිපත් වීම තහනම් කරමින් එවකට රජය ගෙන ආ නීති හේතුවෙන් (අ)(iv)හි සඳහන් නිලධාරීන්ට අසාධාරණයක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එය නිවැරදි කිරීමට ගනු ලබන පියවර කවරේද;

(iii) ඊට අදාළ පනත සංශෝධනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1526/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලාවැව - පැන්නුම රජයේ රෝහල මහවැලි ව්‍යාපාරය ආරම්භ කිරීමටත් පෙර සිට ආරම්භ කරන ලද රෝහලක් බවත්;

(ii) මේ වනවිට එම රෝහලේ ගොඩනැගිලි ඉතා අබලන් තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම රෝහලේ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා මුදල් වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1672/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා ගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වතුකරයේ ජීවත් වන පවුල් අතරින් මේ වනවිට සමෘද්ධි සහනාධාරය ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) සමෘද්ධි ප්‍රතිලාභය වතුකරයේ ජීවත් වන පවුල් වැඩි සංඛ්‍යාවකට ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1895/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ වැඩසටහන හේතුවෙන් 2022 මහ කන්නයේ වී අස්වැන්න විශාල ලෙස අඩු වී තිබෙන බව දන්නේද;

(ii) ඒ සඳහා වන්දි ලබා දීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට ලබා දී ඇති වන්දි මුදල කොපමණද;

(iv) එක් එක් දිස්ත්‍රික්කය අනුව මේ දක්වා වන්දි ලබා දී ඇති ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වන්දි ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2000/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට වාහන අමතර කොටස්වල සහ ටයර්වල හිඟයක් පවතින බවත්;

(ii) ඒ හේතුවෙන් වාහන හිමිකරුවන් දුෂ්කරතාවයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වාහන අමතර කොටස් සහ ටයර් ආනයනය සීමා කිරීම, ඉහත හිඟයට හේතු වී තිබේද;

(ii) එසේ නම්. වාහන අමතර කොටස් සහ ටයර් ආනයනය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2042/2022

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1992 දී වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණයක් සිදු කරන ලද බවත්;

(ii) එම අවස්ථාවේදී රජයේ වතු, ප්‍රාදේශීය වැවිලි සමාගම් 22 කට බදු දෙන ලද බවත්;

(iii) මේ වනවිට එම සමාගම් රාශියක් එම වතු වෙනත් ආයතනයන්ට අතුරු බදු දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1992 දී රජයේ වතු බද්දට ලබා ගන්නා ලද ප්‍රාදේශීය වතු සමාගම් කවරේද;

(ii) මුල් බදු ගිවිසුම් යටතේ මේ වනවිට වතු පාලනය කරනු ලබන සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2060/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට සිමෙන්ති කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා ලබා දෙන ලද ඉඩමේ විශාලත්වය කොපමණද;

(ii) ඉහත කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වන ආයෝජනය කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා වූ ආයෝජන ගිවිසුමට එළැඹි දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2170/2022

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ ගැටලාව, දුටු වැව, තිසා වැව සහ මයිල්ගස් වැව යන ප්‍රදේශවල විශාල වශයෙන් ලූනු වගා කරන ලද බවත්;

(ii) ලූනු සඳහා නිසි මිලක් නොලැබීම හේතුවෙන් ලූනු තොග විශාල ප්‍රමාණයක් මේ වනවිට ගොවීන්ගේ නිවෙස්වල ගබඩා කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ගම්වල ගොවීන් විසින් ගබඩා කරඇති ලූනු අලෙවිකර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ඔක්තෝබර් 04 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2518/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් කුරුණෑගල බුවනෙක හෝටලය කඩා දැමීම සම්බන්ධයෙන් විශාල කතිකාවක් ඇති වූ බවත්;

(ii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම නඩුව සඳහා කුරුණෑගල මහ නගර සභාව විසින් වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම මුදල සම්බන්ධයෙන් විගණන විමසුම් යොමු කර ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම විගණන විමසුම් මඟින් විමසා ඇති කරුණු කවරේද;

(iv) එම කරුණු සම්බන්ධයෙන් මේ වනතෙක් ගෙන ඇති හා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2533/2022

ගරු තවරාජා කලෙයි අරසන් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සොරික්කල්මුනයි-2, සම්මන්තුරෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මයිලෙයිතිවු සහ ආලයඩිවේම්බු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පනංකාඩු, කන්නගි කිරාමම් සහ අලිගම්බේ යන ගම්මානවල ජීවත්වන ජනතාව පානීය ජල හිඟයකට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) ඉහත ගම්මානවල ජීවත්වන පවුල් අතරින් පානීය ජල හිඟයට මුහුණ දී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගම්මානවල පවතින පානීය ජල ගැටලුව විසඳීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නාවිදන්වෙලි, මධ්‍යම කඳවුර, මණ්ඩූර්, ගනේෂපුරම්, වක්කිඇළ, නාමල්ඔය, ඉඟිනියාගල සහ තොට්ටම යන ස්ථානවල ඉදිකර ඇති ජල ටැංකි දීර්ඝ කාලයක සිට භාවිතයට නොගන්නා බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් ඒ ආශ්‍රිත ගම්මානවල ජීවත්වන ජනතාව පානීය ජලය ලබා ගැනීමේදී දැඩි අපහසුතාවකට පත්ව සිටින බව දන්නේද;

(iii) එම ගම්මානවල පවතින පානීය ජල ගැටලුව විසඳීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2536/2022

ගරු මධුර විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වකුගඩු අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදුවිය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2552/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජනාධිපති අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2567/2022

ගරු සංජීව එදිරිමාන්න මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කෞතුකාගාරය ස්ථාපිත කිරීමට අදාළ වැඩ කටයුතු මේ වනවිට අවසන් කර තිබේද;

(ii) එම කෞතුකාගාරය ස්ථාපිත කිරීම සඳහා වැය කරන මුදල කොපමණද;

(iii) එම කෞතුකාගාරයේ ඇති කෞතුක භාණ්ඩ සම්බන්ධයෙන් විධිමත් ලේඛනයක් පවත්වා ගෙන යන්නේද;

(iv) එසේ නම්, එම ලේඛනය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා එම කෞතුකාගාරය විවෘත කරනු ලබන දිනය කවරේද;

(ii) මහජන ප්‍රදර්ශනය සඳහා එම කෞතුකාගාරය විවෘත කිරීමට අපහසුතාවයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2584/2022

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— ගරු අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක් වකුගඩු රෝගියෙක් වෙනුවෙන් ලබා දෙනු ලබන මාසික මූල්‍යාධාරය;

(ii) මූල්‍යාධාර ලබා ගැනීම සඳහා මේ වනවිට ඉල්ලුම්කර ඇති මුළු වකුගඩු රෝගීන් සංඛ්‍යාව;

(iii) මූල්‍යාධාර ලබා ගැනීම සඳහා මේ වනවිට පොරොත්තු ලේඛන ගත වකුගඩු රෝගීන් සංඛ්‍යාව;

(iv) මේ වනවිට මූලාධාර ලබන වකුගඩු රෝගීන් සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2588/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසල්වල බාලදක්ෂ මානවක/මානවිකාවන් පුහුණු කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, එම පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) බාලදක්ෂ මානවක/මානවිකා පුහුණුව ලබා දීමට අපේක්ෂා කරනු ලබන පාසල් තිබෙන බව පිළිගන්නේද;

(iv) එම පුහුණුව ලබාදීම සඳහා, උක්ත පාසල්වල පවතින බාධා හඳුනාගෙන තිබේද;

(v) බාලදක්ෂයන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ගුරුවරුන්ට ලබා දී, එම ගුරුවරු මාර්ගයෙන් පාසල් සිසු සිසුවියන්ට බාලදක්ෂ පුහුණුව ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බාලදක්ෂ මානවක/මානවිකාවන් සමාජ සත්කාර සේවා සඳහා යොදවා ගනු ලබන ආකාරය කවරේද;

(ii) ඒ සඳහා ලබා දෙනු ලබන පහසුකම් බාලදක්ෂ මානවක හා මානවිකාවන් අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බාලදක්ෂ මානවක/මානවිකාවන් සඳහා මේ වනවිට ලබා දෙනු ලබන පහසුකම් ප්‍රමාණවත්ද;

(iv) නොඑසේ නම්, ඉදිරියේදී එම පහසුකම් ඉහළ නැංවීම සඳහා සැලසුම් කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2603/2022

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 ජනවාරි මාසයේ සිට මේ වනතෙක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල දේශපාලන පළිගැනීම් සිදුවන බව දන්නේද;

(ii) එම දේශපාලන පළිගැනීම් මත සිදු කර ඇති සේවක මාරු කිරීම් සහ වැඩ තහනම් කිරීම් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ගේ දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කර ඔවුගේ රැකියා සුරක්ෂිත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2615/2022

ගරු අනුප පස්කුවල් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති මහ වැව් සංඛ්‍යාව;

(ii) එම වැව් අතරින් මේ වනවිට රොන්මඩ ඉවත් කරනු ලබන හා ප්‍රතිසංස්කරණය කරනු ලබන වැව් සංඛ්‍යාව;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල;

(iv) ඉහත (ii) හි සඳහන් වැව් අතරින් මේ වනවිට ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති වැව් සංඛ්‍යාව හා තවදුරටත් ප්‍රතිසංස්කරණය කිරීමට නියමිත වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2622/2022

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට දියර කිරි ලීටරයක විකුණුම් මිල ඉතා විශාල වශයෙන් ඉහළ ගොස් ඇති බව දන්නේද;

(ii) දියර කිරි භාවිතය ප්‍රචලිත කිරීම සඳහා සහ සහනදායී මිලට අලෙවි කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිරි ගොවීන්ට කිරි එළදෙනුන් ලබා දීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කිරි එළදෙනුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කිරි එළදෙනුන් බෙදා දෙන ලද ප්‍රදේශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?